# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1955/3 - 2016 පෙබරවාරි මස 23 වැනි අඟහරුවාදා - 2016.02.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : 4-3/8/2012/P.C./405.
බිං/3/9/අත්/20.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරදාපත්තු කෝරලයේ, මොරගොල්ල ගමේ පිහිටි අ.ග.පි. 2095, අතිරේක අංක 02, පත්‍ර අංක 02 හි සඳහන් ඉඩම් කැබැල්ල.

1. **කැබලි අංක 34**

ඉඩමේ නම: මයිලගහමුල හේන; විස්තරය: වත්ත, අවුරුදු 30-40 වයසැති පොල්ගස් 15, අවු. 25-30 වයසැති කුඹුක් ගස් 01 සහ අවු. 25-30 වයසැති කොහොඹ ගස් 01; හිමිකම් කියන්නා: එල්. ඒ. එස්. මහින්ද ලේකම් මහතා, මොරගොල්ල, නාගොල්ලාගොඩ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1417.

*මායිම්*:

*උතුරට*: 22බී වැනි බිම් කැබැල්ල; *නැගෙනහිරට*: 22ඒ සහ 22 වැනි බිම් කැබලි; *දකුණට*: 22 සහ 09 වැනි බිම් කැබලි; *බටහිරට*: 09 සහ 22බී වැනි බිම් කැබලි.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියකියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2016 මැයි මස 04 වැනි දින පෙ. ව. 10.00 ට බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 අප්‍රේල් මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එම්. ඩී. සෝමරත්න,
ප්‍රාදේශීය ලේකම්,
බිංගිරිය.

2016 පෙබරවාරි මස 17 වැනි දින,
බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 - 194

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 23060 - 16 - (2016/02)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.